Australian Government
Department of Home Affairs

# ඕස්ට්‍රේලියානු පුරවැසියකු, ස්ථිර නේවාසිකයෙකු හෝ සාමාන්‍ය වශයෙන් ඕස්ට්‍රේලියාවේ පදිංචිව සිටින නවසීලන්ත පුරවැසියෙකු

ඔබ ඕස්ට්‍රේලියනු පුරවැසියෙකු, ඕස්ට්‍රේලියානු ස්ථිර නේවාසිකයෙකු හෝ සාමාන්‍ය වශයෙන් ඕස්ට්‍රේලියාවේ පදිංචිව සිටින නවසීලන්ත පුරවැසියෙකු නම්, ඔබට ඕස්ට්‍රේලියාව වෙත පැමිණිය හැකිය.

ඕස්ට්‍රේලියානු ප්‍රජාවගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා ඕස්ට්‍රේලියාව සතුව දැඩි දේශ සීමා ක්‍රියාමාර්ග ඇත. ඕස්ට්‍රේලියාවේ සිට සහ ඕස්ට්‍රේලියාව වෙත දැනට ඉතාම සීමිත ගුවන් ගමන් පමණක් ඇති අතර, මෙම අවස්ථාවේදී ඔබට ගමන් කිරීම කළ නොහැකි වීමට ඉඩ ඇත. ස්මාර්ට්ට්‍රැවලර් බලන්න. ගමන් කිරීම සම්බන්ධ සීමා, වෙනස් කිරීම්වලට යටත්වේ. නිතිපතා පරීක්ෂාකර බලන්න. බලන්න: ජාතික කැබිනට් මණ්ඩල මාධ්‍ය ප්‍රකාශන.

නවසීලන්තයේ සිට නිරෝධායන රහිත ගුවන්යානයක පැමිණෙන්නේ නම් හැර, ඔස්ට්‍රේලියානු පුරවැසියන් ද ඇතුළුව ඔස්ට්‍රේලියාවට පැමිණෙන සියලුම සංචාරකයින් පැමිණෙන නගරයේ ඇති හෝටලයක් වැනි තහවුරු කළ ස්ථානයක දින 14 ක් නිරෝධායනය විය යුතුය. ගමන් කරන අය සඳහා වූ කොරෝනා වෛරස (COVID-19) උපදෙස් බලන්න.

ඔබගේ නිරෝධායනය සඳහා යන වියදම ඔබ විසින් දැරීමට සිදුවිය හැකිය. නිරෝධායන අවශ්‍යතා සම්බන්ධ වැඩිදුර විස්තර සොයා ගැනීම සඳහා අදාල ප්‍රාන්ත සහ ටෙරිටරි රජයේ සෞඛ්‍යය දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවන්න.

## ඕස්ට්‍රේලියානු පුරවැසියන්

ඕස්ට්‍රේලියානු පුරවැසියන් හට ඕස්ට්‍රේලියාවට ඇතුළුවිය හැකි අතර, විශේෂ අවස්ථාවලදී, වලංගු ඕස්ට්‍රේලියානු ගමන් බලපත්‍රයක් නැතිව ඇතුළු විය හැකිය. ඔබ ගමන් කිරීමට පෙර ඔබ පිටත්වන රටෙහි ඇති සීමා සම්බන්ධයෙන් දැනුවත්වී සිටිය යුතුය. ස්මාර්ට්ට්‍රැවලර් බලන්න.

ඔබට වලංගු ගමන් බලපත්‍රයක් නැතිනම්, සහ ගමන් බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර හදිසියේ ගමන් කිරීමට අවශ්‍ය නම්, ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු බවත්, එබැවින් ඕස්ට්‍රේලියාවට ඇතුළුවීමට වීසා බලපත්‍රයක් අවශ්‍ය නැති බවත් ගුවන් සමාගම් කාර්ය මණ්ඩලය වෙත දැනුම් දෙන්න. ගුවන් සමාගම විසින් ඔබගේ පුරවැසිභාවය සනාථ කර ගැනීම සඳහා ඕස්ට්‍රේලියානු දේශසීමා බලකාය සමඟ සම්බන්ධවනු ඇත. ඔබ සතුව ඇති වෙනත් හැඳුනුම් ලේඛන ඔබ රැගෙන ආ යුතුය.

## ඕස්ට්‍රේලියානු ස්ථිර නේවාසිකයන්

ස්ථිර පදිංචිකරුවන්ට සහ තාවකාලික පවුල් වීසා බලපත්‍රලාභීන්ට ඕස්ට්‍රේලියාවට ඇතුළු විය හැකිය. නිදහස් කරන ලද කාණ්ඩ සහ සංචාරක සීමා පිළිබඳ උපදෙස් බලන්න.

ස්ථිර වීසා බලපත්‍ර සඳහා සාමාන්‍යයෙන් අවුරුදු 5 ක සංචාරක පහසුකමක් ඇත. ඔබගේ ස්ථිර වීසා බලපත්‍ර පහසුකම කල් ඉකුත් වන විට ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත සිටී නම්, ඔබට නැවත ඕස්ට්‍රේලියාවට පැමිණිය නොහැක.

ස්ථිර පදිංචිකරුවෙකු ලෙස ඔබට නැවත ඕස්ට්‍රේලියාවට ඇතුළු විය හැක්කේ කෙසේදැයි දැන ගැනීමට, ස්ථිර පදිංචිකරුවන් - බලන්න.

## පළමු පිවිසුම් දිනය (ආරම්භක පැමිණීමේ දිනය)

මෙම තොරතුරු අදාළ වන්නේ පහත සඳහන් ස්ථිර හා තාවකාලික පවුල් වීසා බලපත්‍රලාභීන්ට පමණි:

- හවුල්කරුවන් (උප පන්ති 309 හෝ 100)
- දෙමාපිය වීසා බලපත්‍ර (උප පන්ති 143 හෝ 103)
- ළමා වීසා (උප පන්ති 101 හෝ 102 හෝ 445)
- වෙනත් පවුල් වීසා (උප පන්ති 114, 115, 116, හෝ 117)

ඔබගේ වීසා බලපත්‍රයේ පළමු පිවිසුම් දිනයට පෙර ඔබට ඕස්ට්‍රේලියාවට යාමට නොහැකි නම්, තවමත් ඔබට පසු දිනක ඕස්ට්‍රේලියාවට ඇතුළු විය හැකි වීමට ඉඩ ඇත. ඒ සඳහා ඔබගේ වීසා බලපත්‍රය වලංගු විය යුතු අතර ඔබ අනෙකුත් සියලුම අවශ්‍යතා සහ වීසා කොන්දේසි සපුරාලිය යුතුය.

ඔබ සංචාරය කිරීමට අදහස් කරන විට, ඔබ සංචාරක පහසුකම් ලිපි ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

එවිට ඔබගේ වීසා බලපත්‍රයේ පළමු පිවිසුම් දිනයට පසුව ඔබට ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට අවසර ඇති බව සඳහන් කිරීමට අපි ඔබට සංචාරක පහසුකම් ලිපියක් එවිය හැක. අපි ඔබට සංචාරක පහසුකම් ලිපියක් දෙන්නේ නම්, එය ඔබ සමඟ පිටත්වීමේ ස්ථානයට රැගෙන එන්න. ඔබට එය ගුවන් ගමන් පරීක්ෂා කිරීමේදී සහ ඕස්ට්‍රේලියාවට පැමිණි විට පෙන්වීමට අවශ්‍ය විය හැකිය.

ඔබ ඉහත පවුලේ වීසා බලපත්‍රයක් තබා ගෙන ඔබේ පළමු පිවිසුම් දිනයට මාස 3 කට වඩා අඩු කාලයක් ඉතිරිව තිබේ නම් මිස සංචාරක පහසුකම් ලිපි නිකුත් නොකෙරේ.

**සටහන**: පළමු පිවිසුම් දිනය (පැමිණීමේ පළමු දිනය) 'දිනයෙන් පසු නොපැමිණිය යුතුය' (පැමිණීමට අවසාන දිනය) ට වෙනස් වේ.

ඔබ සංචාරක පහසුකම් ලිපියක් ඉල්ලා සිටින්නේ නම්, ඔබ එය සහතික කළ යුතු කාරණා වන්නේ:

- ඔබට වලංගු ස්ථිර හෝ තාවකාලික පවුල් වීසා බලපත්‍රයක් තිබීම.
- ඔබගේ වීසා ප්‍රදාන ලිපියේ දක්වා ඇති පරිදි පළමු පිවිසුම් දිනය (ආරම්භක පැමිණීමේ දිනය) පසුවී හෝ ඔබ ඔස්ට්‍රේලියාවට පැමිණීමට පෙර අවසන් වීම.
- ඔබ ඉදිරි මාස 12 තුළ ඕස්ට්‍රේලියාවට යාමට අදහස් කිරීම.

ඔබ අනාගත විවාහ (උප පන්තිය 300) වීසා බලපත්‍රයක් දරන්නේ නම්, වැඩි විස්තර සඳහා [වීසා අයදුම්පත් ගාස්තු ආපසු ගෙවීම් සහ නිදහස් කිරීම්](#) බලන්න.

## සාමාන්‍ය වශයෙන් ඕස්ට්‍රේලියාවේ පදිංචිව සිටින නවසීලන්ත පුරවැසියන්

සාමාන්‍ය වශයෙන් ඕස්ට්‍රේලියාවේ පදිංචිව සිටින අය (වීසා උපකාණ්ඩ 444 හෝ වෙනත් ස්ථිර හෝ තාවකාලික වීසා බලපත්‍ර ඇති අය) හට ඕස්ට්‍රේලියාවට පැමිණිය හැකිය.

ඕස්ට්‍රේලියාවට ගුවන් ගත වීමට පෙර ඔබ දින 14 ක් හෝ ඊට වැඩි කාලයක් [නවසීලන්තයේ](#) නොසිටියේ නම්, පැමිණීමේදී පදිංචිය පිළිබඳ ලියකියවිලි පිළිබඳ සාධක ඉදිරිපත් කිරීමට ඔබට හැකි විය යුතුය. මේවාට පමණක් සීමා නොවී, පදිංචිය සනාථ කිරීමේ ලියකියවිලි ලෙස පිළිගත හැකි සාධක වන්නේ:

- පහත දේ තහවුරුවන වෙනත් ලියවිල්ලක් මගින් සනාථවන රජය මගින් නිකුත් කළ ලියකියවිලි (උදාහරණ වශයෙන් ඕස්ට්‍රේලියාවේ නිකුත් කරන ලද රියදුරු බලපත්‍ර, මෙඩිකෙයාර් කාඩ්පත්, ඕස්ට්‍රේලියානු බදු කාර්යාලය සමඟ ඕස්ට්‍රේලියානු නේවාසිකයෙකු වශයෙන් ලියාපදිංචිවීම):
  - ඔබට දැනට ඕස්ට්‍රේලියාවේ රැකියාවක් ඇති බව හෝ ඕස්ට්‍රේලියාවේ අධ්‍යයනයට අනුමැතියක් ඇතිබව (හෝ ඕස්ට්‍රේලියාවේ බැංකු ප්‍රකාශනයක් මගින් තහවුරු කළ හැකි මූල්‍ය උපකාර) හෝ
  - ඕස්ට්‍රේලියාව තුළ ඔබට දේපළ හිමි බව හෝ දේපළ කුලියට ගෙන ඇතිබව (උදා: විදුලි, ජල, ගෑස් බිල්පත්, වරිපනම් දැන්වීම්, බදු ගිවිසුම)

ඔබ ගුවන් තොටුපළේදී චෙක්-ඉන් වන විට මෙම සාධක ඉදිරිපත් කළ හැකිය. ගුවන් යානය වෙත ගොඩ වීමට අවසර දීමට පෙර ඔබගේ ගමන් ඉතිහාසය සමඟින් ඔබගේ පදිංචිය තහවුරු කර ගැනේ. ඔබගේ අවස්ථාගත කරුණු සාමාන්‍ය පදිංචිය යන අර්ථ නිරූපණය තුළට ගැනෙන්නේද යන්න කිසියම් සැකයක් ඇතිනම්, ඔබ පිටත්වීමට

අදහස් කරන දිනට අවම වශයෙන් සති දෙකකට පෙර ඒ සම්බන්ධ ඇගයීමක් කිරීම සඳහාවූ ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසට අපි නිර්දේශ කරමු.

**ඔබගේ ඉල්ලීම යොමු කරන්න**

## මා හට සරණාගත සහ මානව හිතවාදී (XB පංති) වීසා බලපත්‍රයක් ඇත.

යම් අයෙකු ඕස්ට්‍රේලියානු පූරවැසියෙකු හෝ ස්ථිර නේවාසිකයෙකු නම් මිස කෝවිඩ්-19 ගමන් සීමා හේතුවෙන් දැනට කිසිම අයෙකු ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් වළක්වනු ලැබේ.

ඔබ සරණාගත සහ මානව හිතවාදී (XB පංති) වීසා බලපත්රයක් දරන්නේ නම්, ඔබ දැනටමත් ඕස්ට්‍රේලියාවට පැමිණ ඇතිනම් මිස ඔබ ස්ථිර නේවාසිකයෙකු ලෙස නොසැලකේ.

සරණාගත සහ මානව හිතවාදී (XB පංති) වීසා බලපත්රයක් දරණ අය හට බැහැර කිරීමක් සඳහා අයදුම් කර එය ප්රදානය කර ඇතිනම් මිස මෙම අවස්ථාවේදී ඕස්ට්‍රේලියාවට පැමිණිය නොහැක. වැඩිදුර විස්තර සඳහා, ගමන් සීමා බලන්න.

## බැහැර කිරීමක් සඳහා මාර්ගගතව අයදුම් කරන්න

එක් පුද්ගලයෙකු වෙනුවෙන් එක් ඉල්ලීමක් පමණක් යොමු කරන්න. ඉල්ලීම් කිහිපයක් යොමු කිරීම මගින් ඒවා සලකා බැලීම ප්‍රමාද වේ. ඔබට බැහැර කිරීමක් ලබා නොදුන්නේ නම්, ඔබ විසින් සැලසුම් කළ ආකාරයට ගමන් නොකළ යුත්තේ, ඔබට ඕස්ට්‍රේලියාවට පැමිණීම සඳහා ගුවන් යානයකට නැගීමට අවසර ලබා නොදෙන බැවිනි. ඔබට ගමන් කිරීම සම්බන්ධ බැහැර කිරීමක් ලබා දුණි නම්, එම බැහැර කිරීම සම්බන්ධ තීරණයේ සාධක ගුවන් තොටුපළ වෙත රැගෙන යා යුතුය.

නිදහස් කිරීමක් සඳහා මාර්ගගතව අයදුම් කරන්න